සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉතිහාසය - I

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 01යි.

සැලකිය යුතුයි.

- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ(×) ලකුණ යොදන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරිස්සමෙන් කියවන්න.

(01) ශ්‍රී ලංකාවට පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වූයේ,
i සෝල්බරි ii කෝල්බෘක් iii ඩොනමෝර් iv මැනිං

(02) දෙවන ලෝක යුද්ධය පැවති දුෂ්කර අවස්ථාවේ අප රටේ සහාය ලබාදුන් ප්‍රබල රාජ්‍ය වූයේ,
i ජපානය ii ජර්මනිය iii මහාබ්‍රිතාන්‍ය iv ප්‍රංශය

(03) පංච මහා බලවේගයන්හි සහායෙන් ලංකාවේ අගමැති ධූරයට පත් වූයේ,
i ඩී. එස්. සේනානායක මහතා ii සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය
iii එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා iv ජෝන් කොතලාවල මහතා

(04) 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මෙරට ව්‍යවස්ථාදායකය හඳුන්වන ලද්දේ,
i පාර්ලිමේන්තුව ii රාජ්‍ය මන්ත්‍රණ සභාව
iii ව්‍යවස්ථාදායක මණ්ඩලය iv ජාතික රාජ්‍ය සභාව

(05) මෙරට අභියාචනා නඩු විසඳීමේ බලය බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සලයට හිමි වූයේ මින් කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් යටතේ ද?
i කෲව් මැකලම් ii සෝල්බරි
iii මැනිං ඩෙවොන්ෂයර් iv කෝල්බෘක්

(06) වර්තමාන ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වන්නේ,
i 196 ii 200 iii 210 iv 225

(07) මෙරට ගොවි ජනපද ව්‍යාපාරයේ පුරෝගාමියා ලෙස හඳුන්වන්නේ,
i ඩී. එස්. සේනානායක මහතා ii ගාමිණී දිසානායක මහතා
iii ජේ. ආර්. ජයවර්ධන මහතා iii ඩඩ්ලි සේනානායක මහතා

(08) ශ්‍රී ලංකාවේ ප්‍රථම බහු කාර්ය යෝජනා ක්‍රමය ලෙස සැලකෙනුයේ,
i මහවැලි සංවර්ධන ව්‍යාපාරය ii ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය
iii මොරගහකන්ද සංවර්ධන ව්‍යාපාරය iii ඉගිනිමිටිය සංවර්ධන ව්‍යාපාරය

(09) දිවයින පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වන සුවසැරිය ගිලන් රථ සේවාවේ ඇමතුම් අංකය වන්නේ,
i 1919 ii 1920 iii 1990 iv 1938

(10) වර්ෂ 1959 දී පිහිට වූ ප්‍රථම කාර්මික ජනපදය වන්නේ,

i හම්බන්තොට ii රත්මලාන iii හොරණ iv ඒකල

(11) ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත් පැරණිතම කෘතිය වන්නේ,

i පූජාවලිය ii දළදා සිරිත iii මහා වංශය iv දීපවංශය

(12) මෙරටට පැමිණ මෙහි ඇති තතු දැක බලා ඒ පිළිබඳව වාර්තා තැබූ විදේශීය කර්තෘවරයෙකු වූයේ,

i ඉබන් බතූතා ii මෙගස්තිනීස් iii ප්ලිනි iv හියුං සියැං

(13) ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුලත් දකුණු ඉන්දියාවේ රචිත දෙමළ ග්‍රන්ථයක් නොවන්නේ,

i මණිමේකලෛයි ii ශේගරාශසේකර මාලෛ

iii සිලප්පාදිකාරම් iv පදිර්රුපත්තු

(14) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලද ගල්පොත සෙල්ලිපිය පිහිටා තිබෙන්නේ,

i අනුරාධපුරය ii මිහින්තලය iii පොළොන්නරුව iv තන්තිරිමලේ

(15) පැරණි කාසි පිළිබඳව හදාරන විෂය හඳුන්වා ඇත්තේ,

i කාසි විද්‍යාව ii නාණක විද්‍යාව iii භෞතික විද්‍යාව iv තාරකා විද්‍යාව

(16) පොළොන්නරුව රාජ්‍ය සමයේ දී භාවිතා කරන ලද කාසි වර්ගය වන්නේ,

i පුරාණ ii ධරණ iii ස්වස්තික iv තඹමස්ස

(17) පැරණි ප්‍රාදේශීය මායිම් පෙන්වන රූප සටහනක් නොවන්නේ ,

i ඉරහඳරූප ii සඳකඩපහන iii දුන්න iv ගොන්කුරය

(18) අශ්ව හිස සහ මිනිසා දැක්වෙන මූර්තිය පිහිටා ඇත්තේ,

i ඉසුරුමුනි විහාරය ii අභයගිරි විහාරය iii ජේතවනාරාමය iv රුවන්වැලිසෑය

(19) අඩි 45 ක් ගැඹුරින් පිහිටි ඉරණමඩු සැකැස්මට අයත් බොරලු තට්ටුවෙන් ගල් යුගයට අයත් සාක්ෂි සොයාගෙන ඇත්තේ,

i බූන්දල ii වැල්ලෙගංගොඩ iii පතිරාජවෙල iv පාහියන්ගල

(20) පහත දැක්වෙන 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගැලපූ විට පිළිතුර තෝරන්න.

| | 'අ' | | 'ආ' |
|---|---|---|---|
| 1 | ගෝපාලගාම | A - | වළං සාදන්නන් විසූ ගම් |
| 2 | කුම්භකාරගාම | B - | ගොවියන් විසූ ගම් |
| 3 | කසිකාරගාම | C - | ධීවරයින් විසූ ගම් |
| 4 | කේවට්ටගාම | D - | ගොපල්ලන් විසූ ගම් |

i DABC ii DBAC iii DCAB iv DACB

(21) ජනතාව විසින් අතහැර දැමූ වැව්ගම් හඳුන්වා ඇත්තේ ,

i නියම්ගම් ii කේවට්ටගාම iii පට්ටනගාම iv ඕලගම්

(22) ප්‍රාග් ඓතිහාසික මානවයා ගේ උපරිම ආයු කාලය වූයේ,

i වසර 35 - 45 ii වසර 35 - 40 iii වසර 30 - 40 iv වසර 50 - 60

(23) අනුරාධපුර දික්සඳ සෙනෙවියා පිරිවෙනේ වැඩ වාසය කරමින් මහා වංශයේ මුල් කොටස රචනා කරන ලද්දේ,

i ධර්මසේන හිමි ii නාරද හිමි iii මහානාම හිමි iv සුනීත හිමි

(24) ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පහතරටතෙත් කලාපීය ගල්ලෙනක් නොවූයේ,
i පොතාන ii කිතුල්ගල බෙලිලෙන
iii පාහියන්ගල iv බටදොඹලෙන

(25) ගල් යුගයේ විසූවන් මිටිය, ඇඹරුම්ගල වැනි උපකරණ නිපදවා ඇති පාෂාණ වර්ගය වූයේ,
i හිරිගල් ii කළුගල් iii කහදගල් iv තිරුවාන ගල්

(26) ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර සොයා දිනකට ගමන් කල දුර ප්‍රමාණය වූයේ ,
i කි. මී. 10 ii කි. මී. 5 iii කි. මී. 7 iv කි. මී. 2

(27) පනාකඩුව තඹ සන්නසේ අනුරාධපුරය හැඳින්වීමට යොදා ඇත්තේ,
i නුරුපුර ii රජරට iii අනුරපුර iv වැව් බැඳි රාජ්‍ය

(28) වියළි කලාපයේ කෘෂිකර්මාන්තයට වඩාත් උචිත පස වූයේ,
i රතු පස ii රතු දුඹුරු පස iii කලු පස iv මැටි පස

(29) කිරිඳි ඔය හරස් කර අමුණක් බැන්ද වූ රජතුමා වූයේ,
i පළමුවන විජයබාහු ii මහානාග iii කේෂධාතු කාශ්‍යප iv ඉලනාග

(30) ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථානයක් නොවන්නේ,
i පතිරාජවෙල ii මිනිහාගල්කන්ද iii බුන්දල iv හෝටන්තැන්න

(31) දඹුල්ලේ පිහිටි කළුදිය පොකුණ සෙල්ලිපියේ සඳහන්ව ඇත්තේ,
i ගෘහපතිවරුන් පිළිබඳව ii දසගම්ඇත්තන් පිළිබඳව
iii භික්ෂූන් වහන්සේලා පිළිබඳව iii ගමිකයින් පිළිබඳව

(32) බ්‍රාහ්මී සෙල්ලිපියක 'පුරකමත' යනුවෙන් හඳුන්වා ඇති තනතුරු නාමය වූයේ,
i ප්‍රධාන වාස්තු ශිල්පියා ii වෙළඳුන්
ii චිත්‍ර ශිල්පියා iv වෛද්‍යවරයා

(33) මුල් ඓතිහාසික යුගයේ ජීවත් වූ වැසියන් හේන් ගොවිතැනේදී වගා නොකළ බෝගයක් වන්නේ,
i තණහාල් ii තල iii තිරිඟු iv කුරක්කන්

(34) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තව පැවතිබව පෙන්නුම් කරන ප්‍රධාන දර්ශකය වූයේ,
i ගංගා නිම්නවල ජනාවාස පැවතීම ii කුඩා ගම්වැව්වල ව්‍යාප්තිය
iii මහා නගර පැවතීම iv වෙළඳ නගර පැවතීම

(35) සුමන ගේ පවුලට අයත් ලෝහ වැඩ සිය රැකියාව ලෙස කල ගෘහපතියකු භික්ෂූන් වහන්සේලාට ගල් ගුහාවක් පිරිසිදු කොට පූජා කළ බව සඳහන් සෙල් ලිපිය වන්නේ,
i බඹරතලාව ii කොන්ඩවට්ටවාන්
iii කණ්ඩලම iv පෙරියපුලියන්කුලම

(36) පෙරදිග රටවල් වල වැඩිදෙනාගේ එකඟතාවයෙන් රට පාලනය කිරීමේ අයිතිය ලබාගත් පාලකයා හඳුන්වා ඇත්තේ,
i රජු ii මපුරුමුකා iii මහාසම්මත iv පරුමක

(37) මුල් ඓතිහාසික යුගයේ ගමක් තවත් ගමකින් වෙන්ව පැවතියේ,
i කැලෑ තීරයකිනි ii වැවකිනි iii තාප්පයකිනි iv වෙල් යායකිනි

(38) ගමිකයින් ගෘහපතීන් අතරින්ම පත් වූ බව සඳහන්ව ඇති සමන්තපාසාදිකාව රචනා කර ඇත්තේ,
i මහානාම හිමි ii ධර්මසේන හිමි iii කාලිදාස iv බුද්ධඝෝෂ හිමි

(39) පූර්ව ඓතිහාසික යුගයේ පොළොවට ලම්බාකාර වන ලෙස බිත්ති ඉදිකර තිබූ නිවාසයක් පැවති බව කැණීම් වලින් තහවුරු වී ඇත්තේ,

i උඩරංචාමඩම ii රංචාමඩම iii පාහියන්ගල iv බූන්දල

(40) මහාවංස ටීකාව ලෙස හඳුන්වන කෘතිය වන්නේ,

i විනයට්ඨ කතා ii සිහලට්ඨකතා iii උත්තරවිහාරට්ඨ කතා iv වංසත්ථප්පකාසිනී

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## ඉතිහාසය - II

**නම/විභාග අංකය :- ...........................................................** **කාලය: පැය 03 යි.**

සැලකිය යුතුයි:
- සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1 කොටස

(01) (අ) පහත (i) යටතේ ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ත්‍රිකුණාමලය, බුන්දල, වලවේ ගඟ, පාහියන්ගල, යෝධ වැව, මහනුවර, දඹකොළ පටුන, කදම්බ නදිය, පොළොන්නරුව, කාලතිත්ථ, ගාල්ල, යාපනය (ලකුණු 12)

(ii) පෘතුගාලය, මහා බ්‍රිතාන්‍යය, ඕලන්දය, රතු මුහුද, සුබපැතීමේ තුඩුව, ඉන්දියාව (ලකුණු 06)

(ආ) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන්, ස්ථාන හා ඓතිහාසික මූලාශ්‍ර අනුපිළිවෙළින් ලියන්න.

(i) A - නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයා
B - ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර සාසන ඉතිහාසය පිළිබඳ ලියැවී ඇති කෘතිය
C - මෙරට ඉහළම අධිකරණ ආයතනය
D - නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය හඳුන්වා දුන් මෙරට අධ්‍යාපන ඇමතිවරයා (ලකුණු 04)

A හා B යටතේ ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් පිළිතුරු පත්‍රයේ ලියන්න.

(A)



(ii) 1 මෙම රූපයේ සිටින්නේ කවරෙකු ද?
2 මොහු කිනම් විෂයයක නිපුනතාවයක් දැක්වූයේ ද?
3 මොහු කිනම් ජාතිකයෙක් ද ?
4 මොහු ජීවත් වූ රට කුමක්ද? (ලකුණු 04)

(B)



(iii) 1 මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2 මෙය කිනම් යුගයකට අයත් වූයේ ද?
3 මෙය සොයාගත් ස්ථානය කුමක්ද?
4 මේවායේ ආදාහනය කර ඇත්තේ කුමක්ද? (ලකුණු 04)

## 11 කොටස

(02) (i) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉදි වූ නව ජලාශ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් A, B, C හා D කරුණට අදාල වරහන තුලින් තෝරා ලියන්න.
(සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, විලියම් ගොපල්ලව මහතා, සුරේන්ද්‍රනාත් බැනර්ජි මහතා, මහත්මා ගාන්ධිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, ජේ.ආර්. ජයවර්ධන මහතා)

A - ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා
B - අවිහිංසාවාදයේ පියා
C - ලොව ප්‍රථම අගමැතිවරිය
D - ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරයා (ලකුණු 04)

(iii) ගොවි ජනපද ආරම්භ කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) a - මූලික මිනිස් අයිතිවාසිකම් හතරක් සඳහන් කරන්න.
b - මූලික මිනිස් අයිතිවාසිකම් කඩවුවහොත් ගත හැකි පියවර දෙකක් දක්වන්න. (ලකුණු 06)

(03) (i) සෙල්ලිපි ලියා ඇති ගල්වල ස්වරූපය අනුව වර්ග කළ හැකි ආකාර තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) පහත A සිට D දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුර වරහන් තුලින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - අනුරාධපුර මුල් යුගයේ ශිලාලිපිවල භාවිතා වූ අක්ෂර මාලාව හඳුන්වන නම
B - මෙරට ඉතිහාසය අඛණ්ඩව ලියවෙන සාහිත්‍ය ග්‍රන්ථය
C - ගල්පොත සෙල්ලිපිය කරවන ලද රජතුමා
D - පුරා විද්‍යාත්මක කැනීම්වලින් ශ්‍රී ලංකාවේ හමුවූ පැරණිතම කාසිය

(පාලි, කහාපණ, බ්‍රාහ්මී, දීපවංශය ,නිශ්ශංකමල්ල, මහාවංශය, මහා විජයබාහු ) (ලකුණු 04)

(iii) පැරණිතම සෙල්ලිපිවල වාර්තා කර තිබූ කරුණු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

(iv) ඉතිහාසය ඉගෙනීමෙන් ලද හැකි ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) අනුරාධපුර රාජධානි සමයේ දී මෙරටින් හමු වූ විදේශීය කාසි අයත් රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් ග්‍රන්ථ රචනා කරන ලද විදේශීය ලේඛකයින් පිළිවෙලින් ලියන්න.

A - ඩිමුන්ඩෝ
B - එදා හෙල දිව
C - නැචුරලිස් හිස්ටෝරියා
D - ඉන්ඩිකා (ලකුණු 04)

(iii) පැරණි චිත්‍ර මෙරට ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන ආකාරය කරුණු දෙකකින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) A – පුරා විද්‍යාත්මක මූලාශ්‍ර විනාශවීමට බලපා ඇති හේතු තුනක් සඳහන් කරන්න.
B – පුරා විද්‍යා මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 3 × 2)

(05) (i) ප්‍රාග් ඓතිහාසික මානවයන් මෙවලම් තැනීම සඳහා භාවිතා කළ පාෂාණ වර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(ii) ගල් යුගයට අයත් ප්‍රජාව වාසය කළ ප්‍රධාන පරිසර කලාප හතරක් නම් කරන්න. (ලකුණු 4)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් අභිචාර විධි සම්බන්ධ සාක්ෂි තුනක් ඉදිරිපත් කරන්න. (ලකුණු 5)

(iv) ගල් යුගයේ වාසය කළ මානවයින්ගේ ආහාර රටාවේ ස්වභාවය කරුණු තුනක් මගින් විස්තර කරන්න. (ලකුණු 6)


(06) (i) පූර්ව ඓතිහාසික යුගයට අයත් මහාශිලා සුසාන පිහිටි ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) මුල් ඓතිහාසික යුගයට අයත් වාපිගාම හතරක් නම් කරන්න. (ලකුණු 4)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මිනිසුන්ගේ කැපී පෙනෙන පරිවර්තනීය ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 5)

(iv) මුල් යකඩ යුගයට අයත් ජනයාගේ ජීවන රටාව පිළිබඳ රත්නපුර දිස්ත්‍රික්කයේ උඩරංචාමඩම ප්‍රදේශයෙන් සාක්ෂි රැසක් කැණීම්වලින් සොයාගෙන ඇත. කරුණු තුනකින් විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i)



(01) (අ) (ii)



## 1 0 ශ්‍රේණිය පළමු වාරය ඉතිහාසය 11 පත්‍රය පිළිතුරු

### 1 කොටස

| | | | |
|---|---|---|---|
| 1 - i | 11 - iv | 21 - iv | 31 - ii |
| 2 - iii | 12 - i | 22 - ii | 32 - i |
| 3 - iii | 13 - ii | 23 - iii | 33 - iii |
| 4 - iv | 14 - iii | 24 - i | 34 - ii |
| 5 - ii | 15 - ii | 25 - ii | 35 - iv |
| 6 - iv | 16 - iv | 26 - iii | 36 - iii |
| 7 - i | 17 - ii | 27 - i | 37 - i |
| 8 - ii | 18 - i | 28 - ii | 38 - iv |
| 9 - iii | 19 - iii | 29 - iv | 39 - i |
| 10 - iv | 20 - i | 30 - iv | 40 - iv |

(ලකුණු 2×40=80)

### 11 කොටස

(01) (ආ) (i) A - ඩී.එස්.සේනානායක මහතා
B – නිකාය සංග්‍රහය
C - ශ්‍රේෂ්ඨාධිකරණය
D- සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා (ලකුණු 1×4)

(ii) 1 ක්ලෝඩියස් ටොලමි
2 භූගෝල විද්‍යාව
3 ග්‍රීක රෝමානුවෙකි
4 ඇලෙක්සැන්ඩ්‍රියාව (ලකුණු 1×4)

(iii) 1 මැටි ඔරු සුසානය
2 පූර්ව ඓතිහාසික යුගය
3 රංචාමඩම
4 මිනිස් ඇටසැකිලි (ලකුණු 1×4)

(2) (i) වික්ටෝරියා /කොත්මලේ/මාදුරුඔය/රන්දෙනිගල/රන්ටැඹේ/රත්කිඳ/මොරගහකන්ද (ලකුණු 1 × 3)

(ii) A - ජේ.ආර්.ජයවර්ධන
B - මහත්මා ගාන්ධිතුමා
C - සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය
D - විලියම් ගොපල්ලව මහතා (ලකුණු 1 × 4)

(iii)
- ⋆ රටේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම
- ⋆ වියළි කලාපයේ පැරණි වැව් හා වාරිමාර්ග අලුත්වැඩියා කොට එහි ඉඩම් ආර්ථික සංවර්ධනයට යොදා ගැනීම
- ⋆ තෙත් කලාපයේ ඉහල යමින් පවතින ජනගහන තදබදය හා රැකියා හිඟය අඩු කිරීම
- ⋆ ගොවි ජනපද පිහිටුවීම (කරුණු තුනට ලකුණු 3 විස්තරයට ලකුණු 2)

(iv) A -
- ⋆ කතාකිරීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය
- ⋆ කැමති රැකියාවක් කිරීමේ අයිතිය
- ⋆ කැමති ආගමක් ඇදහීමේ අයිතිය
- ⋆ වධහිංසාවලින් මිදීමේ අයිතිය
- ⋆ නීතිය ඉදිරියේ සමානාත්මතාවය

B – ශ්‍රේෂ්ඨාධිකරණය, මානව හිමිකම් කොමිසම, ඔම්බුඩ්ස්මන්වරයා (ලකුණු 1x 6)

(03) (i) ලෙන් ලිපි, ගිරි ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි, ආසන ලිපි (ලකුණු 1 × 3)

(ii) A – බ්‍රාහ්මී B – මහා වංශය C –නිශ්ශංකමල්ල D – කහාපණ (ලකුණු 1 × 4)

(iii) ⋆ භික්ෂූන්ට ලෙන් පිදීම
⋆ වැරදිකරුවන්ට සමාව දීම
⋆ විහාරාරාම වලට ගම්බිම් පිදීම
⋆ විහාරාරාම පාලනය
⋆ රජයේ නීති මහජනයාට දැනුම්දීම
⋆බදු අයකිරීම
⋆ වෙළඳාම
(කරුණු තුනට ලකුණු 3 විස්තරයට ලකුණු 2)

(iv) ⋆ තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය
⋆ අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීම.
⋆ රටේ ජාතික අනන්‍යතාව හඳුනා ගැනීම
⋆ මනුෂ්‍යත්වයට ආදරය කිරීමෙන් ජාතික සමගිය ගොඩනැගීම
⋆ අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීම
⋆ විවිධ මත ඉවසීමට හුරුවීම (කරුණු තුනට ලකුණු 03 විස්තරයට ලකුණු 03)

(04) (i) රෝමය, චීනය, ඉන්දියාව , අරාබිය (ලකුණු 1 × 3)
(ii) A – ඇරිස්ටෝටල් B – රොබට් නොක්ස් C - ප්ලිනි D – මෙගස්තිනීස් (ලකුණු 1 × 4)

(iii) - අතීත ජනතාවගේ ඇඳුම් පැළඳුම්, ආභරණ පරිහරණය, වර්ණ භාවිතය, කොන්ඩා මෝස්තර, රූපලාවන්‍ය කටයුතු උදා සහිතව විස්තර කිරීම (ලකුණු 5)
(iv) A – ⋆ සීඝ්‍ර නාගරික ජනාවාස ව්‍යාප්තිය
⋆ මංමාවත් තැනවීම
⋆ ගොඩනැගිලි ඉදි කිරීම
⋆ කෘෂිකාර්මික යෝජනා ක්‍රම
⋆ වටිනා දෑ ඇතැයි සිතා කරන විනාශ කිරීම් (ලකුණු 1 × 3)


B – ⋆ ලියන ලද විස්තරයට අනුව (ලකුණු 3)


(05) (i) තිරුවානා, කහඳ, කළු ගල්
(ii) ⋆ අර්ධ ශුෂ්ක කලාපය
⋆ පහතරට වියළි කලාපය
⋆ පහතරට අතරමැදි වියළි කලාපය
⋆ තෙත් කලාපය
⋆ කඳුකර වියළි අතරමැදි කලාපය
⋆ ශුෂ්ක කලාපය (ලකුණු 1 × 4)

(iii) ⋆ රාවණා ඇල්ල ලෙන් ⋆ පාහියන්ගල ⋆ බටදොඹ ලෙන
ඉහත ස්ථානවල පැවති අභිචාර විධි හැඳින්වීම (ලකුණු 5)
(iv) ⋆ සතුන් දඩයම් කිරීම උදා
⋆ ශාකමය ආහාර උදා
⋆ ගොළුබෙල්ලන් කලපු බෙල්ලන් ලුණු භාවිතය (ලකුණු 2 × 3)

(06) (i) ඉබ්බන්කටුව, ගල්සොහොන් කනත්ත , යටිගල්පොත්ත (ලකුණු 1 × 3)
(ii) සුමනවාපීගාම, විහාරවාපීගාම, සුන්දරීවාපිගාම, කඩහවාපිගාම (ලකුණු 1 × 4)
(iii) ⋆ පිලිස්සූ මැටි වළං භාවිතය
⋆ ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි
⋆ යකඩ ලෝහ භාවිතය
⋆ ස්ථිර ජනාවාස ඉදි කිරීම
⋆ කෘෂිකර්මාන්තය ඇරඹීම (කරුණු 3 ට ලකුණු 3 යි විස්තරයට ලකුණු 222 යි)

(iv) ⋆ උඩරංචාමඩම නිවසින් වළං කටු හමුවීම, පින්තාරු කළ වළඳක කොටසක් හමුවීම, සකපෝරුව භාවිතය,
⋆ මුලුතැන්ගෙය තුලින් ගල් හා යකඩ මෙවලම් හමුවීම, දඩයම් කරන ලද සතුන්ගේ ඇට කැබලි හමුවීම
⋆ රූපලාවන්‍ය කටයුතු උදා මැටි පබළු, ඇස් අඳුන් තැබීමට භාවිතා කරන ලෝහ කූර, සිරුර වර්ණ ගැන්වීම සඳහා යොදාගත් කහ හා රතු පැහැති ගුරු ගල්, ඇඹරුම් ගල් (විස්තරයට ලකුණු 2×3)


දඹකොළපටුන
යාපනය
කදම්බ නදිය
ත්‍රිකුණාමලය
මහනුවර
ගාල්ල
කිරින්ද
වලවේ ගඟ
උ


මහා බ්‍රිතාන්‍ය
ඕලන්දය
පෘතුගාලය
රතු මුහුද
ඉන්දියාව